ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව
இலங்கைப் பொதுப் பயன்பாடுகள் ஆணைக்குழு
PUBLIC UTILITIES COMMISSION OF SRI LANKA

| ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | අපේ අංකය<br>எமது இல.<br>Our No. | දිනය<br>திகதி<br>Date |
|---|---|---|

2022 ජනවාරි 25

**<u>ප්‍රවෘත්ති නිවේදනය</u>**

අද දින සිට ජනාවාරි 27 දක්වා විදුලි කප්පාදුවක් සඳහා අවශ්‍යතාවයක් නොමැති බැවින් විදුලි කප්පාදුවක් සඳහා ලංකා විදුලි බල මණ්ඩලය කල යෝජනාව ජනවාරි 27වන දින නැවත සලකා බැලීමට ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව තීරණය කර තිබේ. මෙම දින 3 තුල විදුලි ජනනය සඳහා ප්‍රමාණවත් ඉංධන තොග පවතී.

මේ පිළිබඳ වැඩිදුර කරුණු පැහැදිලි කරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සභාපති ජනක රත්නායක මහතා.

"පවත්නා ඉංධන තොග හා ඒවා බලාගාර වලට ලබාදිය හැකි දිනයන් පිළිබඳ තොරතුරු ලංකා ඛණිජ තෙල් සංස්ථාවෙන් ඉල්ලා තිබෙන අතර ලබන 27 වැනිදා නැවතත් විදුලි කප්පාදු යෝජනාව පිළිබඳ සමාලෝචනයක් කෙරෙනු ඇත. මේ මස අග වන විටදී බොර තෙල් තොගයක් මෙරටට ලැබීමට නියමිත අතර පිරිපහදු කටයුතු ඇරඹීමෙන් අනතුරුව දැවි තෙල් හා නැප්තා ඉංධන මගින් ජනන කටයුතු කරන බලාගාර වලට අවශ්‍ය ඉංධන ලැබෙනු ඇති. එසේම දැනට අලුත්වැඩියා කෙරෙමින් පවතින නොරොච්චෝලේ බලාගාර 3 වන ඒකකය මේ මස නිමාවීමට ප්‍රථම නැවත විදුලි ජනනය ආරම්භ කිරීමටද නියමිතයි. ඒ අනුව අඛණ්ඩ විදුලි සැපයුමක් ලබාදීමට හැකිවනු ඇතැයි ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විශ්වාසය පල කරනවා. මීට අමතරව ගල් අඟුරු හා අනෙකුත් ඉංධන ආනයනය සඳහා අවශ්‍ය විදේශ විනිමය සොයාගැනීම සම්බන්ධයෙන් අපි ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමා සමගත් සාකච්ඡා කළා. ඉදිරියේදී මේ විදේශ විනිමය ගැටළුවත් විසඳෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා"

මේ අතර විදුලි අර්බුදයට කෙටිකාලීන හා මැද කාලීන විසඳුම් ගණනාවක් ද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර තිබේ. විදුලිපාරිභෝගික ජනතාවගේ සහාය ඇතිව කඩිනම් විදුලි සංරක්ෂණ වැඩපිළිවෙලක් හරහා විදුලි ඉල්ලුම අඩුකිරීම කෙටිකාලින යෝජනා අතර වනවා. මීට අමතරව මැදකාලීන විසඳුමක් ලෙස රාජ්‍ය ආයතන හා පුද්ගලික අංශය සතු ජනන යන්ත්‍ර ඵලදායී ලෙස භාවිතයට ගැනීම සඳහා ද දැනටමත් පියවර ගෙන තිබේ. විවිධ ආයතන සතුව මෙගා වොට් 3000කට වැඩි ධාරිතාවයක් සහිත විදුලි ජනක යන්ත්‍ර භාවිතා වන අතර මෙවැනි විදුලි හිඟ අවස්ථාවලදී එම විදුලි ජනන යන්ත්‍ර වලින් කාර්යක්ෂම ලෙස විදුලිය සපයා ගැනීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වාදීමට නියමිතයි. එසේම ඉදිරියේදී මෙවැනි ජනන යන්ත්‍ර ජාතික විදුලි පද්ධතියට සම්බන්ධ කිරීම සඳහා ඇති හැකියාව පිළිබඳ වද අධ්‍යනය කෙරෙමින් පවතී. සූර්ය බල පද්ධති හා සුළං බල පද්ධති කඩිනමින් සවිකල යුතු බවටද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව නිර්දේශ කර තිබේ.

ජනක රත්නායක
සභාපති
ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව

06.වන මහල, ලංකා බැංකු වෙළඳ කුළුණ, 28. ශාන්ත මයිකල් පාර, කොළඹ 03.
06 ஆவது மாடி, இலங்கை வங்கி வர்த்தகக் கோபுரம், 28, சென் மைக்கல் வீதி, கொழும்பு 03.
Level 06, BOC Merchant Tower, 28, St. Michael's Road, Colombo 03, Sri Lanka.

Tel : +94 11 2392607/8 Fax : +94 11 2392641 E-mail: info@pucsl.gov.lk Web : www.pucsl.gov.lk

සභාපති / தலைவர் / Chairman +94 11 2392606
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General +94 11 2392606